# 10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## ආණ්ඩුව



අන්තර්ගතය - ඒ.එම්.ආර්.ඩබ්.එස්.අමරතුංග-ගුරු උපදේශක-රත්නපුර කලාපය
සැකසුම - බී.චිරන්තනී කාරියවසම්-කු/මලියදෙව බාලිකා විද්‍යාලය-කුරුණෑගල

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# ආණ්ඩුව

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය

| ව්‍යවස්ථාදායකය | විධායකය | අධිකරණය |
|---|---|---|
| * ප්‍රධානියා අගමැති ප්‍රමුඛ පාර්ලිමේන්තුවයි<br>* නීති පැනවීම<br>* මුදල් පාලනය<br>* විධායකය පාලනය | * ප්‍රධානියා ජනාධිපතිය<br>* නීති ක්‍රියාත්මක කරයි | * ප්‍රධානියා අගවිනිසුරුය<br>* යුක්තිය පසඳාලීම<br>* පුරවැසි අයිතිවාසිකම් සුරැකීම<br>* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම |

# ව්‍යවස්ථාදායකය

නිශ්චිත කාල සීමාවක් සඳහා මැතිවරණයක් මඟින් සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ව්‍යවස්ථාදායක මණ්ඩලයට නියෝජිතයින් තෝරා පත් කර ගනු ලබයි.





# විධායකය

ව්‍යවස්ථාදායක මඟින් පණවන නීති ක්‍රියාවට නංවන ආයතනය විධායකයයි.



# අධිකරණය

ව්‍යවස්ථාදායක මඟින් පණවන නීති විධායකය මඟින් ක්‍රියාවට නැංවීමේ දී පැන නඟින ගැටළු නිරාකරණය කරනු ලබන්නේ අධිකරණය මඟිනි.





“ආණ්ඩුවේ ප්‍රධාන කොටස් ලෙස සැලකෙන ව්‍යවස්ථාදායකය , විධායකය හා අධිකරණය සකස් වන ආකාරය ,ඒවා සතු බලතල , ඒවා ක්‍රියාත්මක වන ආකාරය,එම ආයතන හා පුරවැසියන් අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය යනාදිය පිළිබඳ මූලික සිද්ධාන්ත ඇතුලත් ලියවිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.”

**-මහාචාර්ය අයිවර් ජෙනිග්ංස්-**

ආණ්ඩුවක් ,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීමෙන් ,

* පාලනය ක්‍රමවත් වේ.
* පාලනය පිළිබඳ ව විශ්වාසය ඇති වේ.
* අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වේ.
* මූලික අයිතිවාසිකම් රැකේ.
* නීතියේ රැකවරණය සැමටම සමානව ලැබේ.
* පුරවැසි අයිතිවාසිකම් ගැන දැනුවත් වේ.
* පාලකයන් අත්තනෝමතික වුවහොත් එය වළකා ගත හැක.

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

- මාධ්‍ය නිදහස හා තොරතුරු ලබා ගැනීමේ අයිතිය
- අධිකරණයේ ස්වාධීනත්වයේ
- නීතියේ ආධිපත්‍ය හා නීතිය ඉදිරියේ සමානාත්මතාව

# ආණ්ඩු ක්‍රමය

- පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
- ජනාධිපති ආණ්ඩු ක්‍රමය

# පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය



නාමික විධායකය හා දේශපාලනික විධායකය ලෙස අංග දෙකකි.

ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තෝරයි.

විධායකය තම කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට වග කිව යුතුය.

ව්‍යවස්ථාදායකයට සැමවිටම විධායකය ඉවත් කළ හැකිය.

# ජනාධිපති ආණ්ඩු ක්‍රමය

     

විධායක බලය ජනාධිපති විසින් හසුරවනු ලබයි.

රාජ්‍යය නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයා ද ජනාධිපතාවරයාය.

ව්‍යවස්ථාදායකයට වගකීම බැඳී නැත.

ව්‍යවස්ථාදායකයේ පාලනයට යටත් නොවේ.

පින්තූර - අන්තර්ජාලය ඇසුරෙනි...